විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS
ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක : 03/2021

ඔබේ අංකය / உமது இல. / Your No. } ....

දිනය / திகதி / Date } 2021.01.29

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2020 අනුව මාර්ගගත ක්‍රමයට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම සඳහා වන උපදෙස් මාලාව

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2020 මඟින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සක්‍රිය කිරීම සඳහා වන බලතල ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලබා දී ඇත.

02. ඒ යටතේ කටයුතු කිරීමේ දී සැළකිලිමත් විය යුතු නෛතික විධිවිධාන හා නිවැරදි ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ දී මුහුණ දෙන ප්‍රායෝගික ගැටලුවල දී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් මේ සමඟ නිකුත් කරමි.

03. තවද, වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී අවස්ථානුකූලව පරීක්ෂා කළ යුතු කරුණු ඇතුළත් පිරික්සුම් ලේඛන ද සකස් කර ඇති අතර, එම ආකෘති ද මේ සමඟ අමුණා ඇත.

04. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සක්‍රිය කිරීමේ දී මෙම මාර්ගෝපදේශය හා පිරික්සුම් ලැයිස්තු නෛතික විධිවිධානවලට යටත්ව අවස්ථානුකූලව භාවිතා කළ යුතු බව කාරුණිකව දන්වමි.

ඒ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 1. ලේකම්, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
2. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.

මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2020 අනුව මාර්ගගත ක්‍රමයට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සැකසීම සඳහා වන උපදෙස් මාලාව.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2020 මගින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් අනුමත කිරීමේ බලය හිමිවන අතර එම ක්‍රියාවලියේ දී නිවැරදි හිමිකම තහවුරු කිරීමට හා වැරදි අවම වන සේ විශ්‍රාම වැටුප සැකසීම සඳහා සංක්ෂිප්ත වශයෙන් පහත උපදෙස් මාලාව නිකුත් කරනු ලැබේ.

1. **වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු/ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී විශේෂයෙන් අවධානය යොමු කළ යුතු නෛතික විධිවිධාන.**

1.1 1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනතේ වගන්ති

<u>18(1) වන වගන්තිය</u>

මෙම ආඥාපනතේ කාර්යයන් සඳහා යම් නිලධාරියෙකුගේ පවත්නා විවාහවලින් කාලය අනුව පළමුවැන්න වලංගු විවාහය ලෙස සැළකිය යුත්තේ ය.

<u>18(4) වන වගන්තිය</u>

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී වලංගු විවාහයක් අත්‍යවශ්‍ය බව

<u>28 වන වගන්තිය</u>

විවාහයෙන් වසරක් ඇතුළත දරුවන් නොලබා මිය යන දායකයන් සම්බන්ධයෙන් වන විධිවිධාන

<u>29 (අ) වන වගන්තිය</u>

සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වූ අනත්දරුවන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් හිමිගැන්වීම

<u>33 (2) වන වගන්තිය</u>

කුලවද්දා ගන්නා ලද දරුවෙක්ට වැන්දඹු අනත්දරු හිමිකම ලැබෙන බව

<u>34 වන වගන්තිය</u>

වැන්දඹුවකගේ නැවත විවාහය

<u>35 වන වගන්තිය</u>

දායකයෙකුගේ පෙර විවාහයේ දරුවන්ට අනත්දරු හිමිකම ලබා දීම

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

<u>39 වන වගන්තිය</u>

වැන්දඹුවක විසින් අනත්දරුවා නොතකා හැරීම

<u>43 වන වගන්තිය</u>

යම් දායකයෙකු දායකකමින් ඉවත් වූ පසු සිදු කරගන්නා ලද විවාහ

1.2 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ වගන්ති

<u>11 වන වගන්තිය</u>

විවාහයෙන් වසරක් ඇතුළත දරුවන් නොලබා මිය යන දායිකාවක් සම්බන්ධයෙන් වන විධිවිධාන

<u>13 වන වගන්තිය</u>

සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වූ අනත්දරුවන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් හිමිගැන්වීම

<u>18 වන වගන්තිය</u>

වැන්දඹු පුරුෂයෙකුගේ නැවත විවාහය

<u>19 වන වගන්තිය</u>

දායිකාවකගේ පෙර විවාහයකින් ලැබුණු දරුවන් සම්බන්ධව කටයුතු කිරීම

<u>22 වන වගන්තිය</u>

වැන්දඹු පුරුෂයා විසින් අනත්දරුවා නඩත්තු කිරීම පැහැර හැරීම

<u>25 වන වගන්තිය</u>

දායක මුදල් ගෙවීම නතර වීමෙන් පසුව සිදු කර ගන්නා විවාහ සම්බන්ධයෙන් වන විධිවිධාන

1.3 වැදගත් චක්‍රලේඛ

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2020
  (වැන්දඹු / වැන්දඹු පුරුෂ /අනත්දරු/ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කිරීම.)

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 02/2016
  (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු ක්‍රමය යටතේ ලියාපදිංචිය අන්තර්ජාලය හරහා සිදු කිරීම සංශෝධනය කිරීම.)

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2013
  (විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010 යටතේ වැන්දඹු වැටුපෙන් 50% ක් ගෙවීම සම්බන්ධව වැටුප ගණනය කිරීම.)

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2010
  (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ සංශෝධන ක්‍රියාත්මක කිරීම)

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2009
  (අබාධිත විශ්‍රාම වැටුප් ගෙවීම ප්‍රතිශෝධනය කිරීම)

- 1719/3 අංක දරණ 2011.08.15 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/99
  (අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධව අදාළ වේ.)

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2014
  (හිමිකම් පෑමේ අවසන් දිනය)

- විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2008
  (වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගණනය කිරීම.)

සැලකිය යුතුය. (විශ්‍රාම වැටුප් චක්‍රලේඛන , අණ පනත් පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.)

2. විශ්‍රාම වැටුප් ලබමින් සිටින නිලධාරියෙකු වෙනුවෙන් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු හා ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි ගැන්වීම.

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයෙකු මියගිය අවස්ථාවක ඔහු වෙනුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප නීත්‍යානුකූල කලත්‍රයාට හෝ අනත්දරු වයසේ පසු වන්නා වූ දරුවන්ට හෝ නිත්‍යාබාධිත තත්ත්වයේ පසු වන්නා වූ දරුවන්ට හෝ හිමි ගන්වනු ලැබේ.

මෙහි දී ප්‍රතිලාභී පාර්ශවය තමා පදිංචි/විශ්‍රාමිකයා තම විශ්‍රාම වැටුප ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් විය යුතු අතර පහත ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

- මියගිය විශ්‍රාමිකයාගේ මරණ සහතිකය

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

- විවාහ සහතිකය
- ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපත්
- බැංකු තොරතුරු
- දෙපාර්ශවයේ ම පෙර විවාහ සිදුව තිබේ නම් එකී විවාහ නිත්‍යානුකූලව අවසන් වීම තහවුරු කිරීමට අවශ්‍ය දික්කසාද නියත තීන්දු ප්‍රකාශය හෝ මරණ සහතික
- දරුවන්ගේ උප්පැන්න සහතික (අනත්දරු ගෙවීමක දී)
- අවස්ථානුකූලව ඉල්ලුම් කරනු ලබන වෙනත් ලේඛන
- උප්පැන්න සහතිකයේ 12 තීරය හෝ 13 තීරය මඟින් වැන්දඹුව/වැන්දඹු පුරුෂයා නම වෙනස් කර ඇති විට එහි පිටපතක්

එකී ලේඛන නිසි පරිදි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරුගේ නීත්‍යානුකූල බව පිළිබඳව තහවුරු කරගත යුතු ය. දායකයාට හෝ කලත්‍රයාට පෙර විවාහ පැවතියේ නම් එකී විවාහ නීත්‍යානුකූලව දික්කසාද නියත තීන්දුවක් ලබා හෝ මරණයකින් අවසන් වී තිබිය යුතු ය. එබැවින් අදාළ ලියකියවිලි ලබා ගැනීම අනිවාර්ය වේ. (මේ සඳහා 1907 අංක 19 දරණ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 46 වන වගන්තිය කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.)

<u>වැන්දඹු විශ්‍රාම වැටුප ගණනය කිරීම</u>

❖ විශ්‍රාම වැටුපක් ලබමින් සිටි විශ්‍රාමිකයෙකු මිය ගිය අවස්ථාවකදී එම විශ්‍රාමිකයා අවසන් වරට ලද විශ්‍රාම වැටුප පදනම් කරමින් වැන්දඹු විශ්‍රාම වැටුප සකස් කළ යුතුය.

❖ සන්නද්ධ සේවා විශ්‍රාම වැටුපක් ලබමින් සිටි විශ්‍රාමිකයෙකු මියගිය විටක ඊට අදාල වැන්දඹු වැටුප සකස් කිරීම සඳහා සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය මඟින් එවනු ලබන අයදුම්පතෙහි දක්වා ඇති වැටුප වැන්දඹු වැටුප ලෙස පද්ධතියට ඇතුලත් කළ යුතුය.

<u>සැළකිය යුතුයි</u>

වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ලබා වයස අවු. 55 දක්වා වැටුප් ලබමින් සිටි සන්නද්ධ සේවා නිලධාරියෙකු වයස අවු. 55 සම්පූර්ණ වීමට පෙර මිය යන අවස්ථාවකදී ඊට අදාල වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව යොමු නොකළ යුතු අතර එම ලිපිගොනු ඉදිරි කටයුතු සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

<u>වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම.</u>

❖ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කළ යුතුය.වැන්දඹු විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කළ පසු (පද්ධතියේ wop payment processing completed ලෙස දැක්වෙන විට) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් විෂයභාර නිලධාරී හට අදාල වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය පද්ධතිය මඟින් මුද්‍රණය කරගත හැකිය.

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

2.1 විවාහ ගැටළු

2.1.1 බහු විවාහ පැවතීම

විශ්‍රාමිකයෙකු මිය යන අවස්ථාව වන විට ඔහුගේ පළමු විවාහය නිත්‍යානුකූලව අවසන් නොවී දෙවන විවාහයක් සිදුව ඇත්නම් 1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතේ 18 වන වගන්තිය අනුව, කාලය අනුව ප්‍රථමයෙන් සිදු වූ විවාහය වලංගු විවාහය සේ ගත යුතු ය. එම ප්‍රථම විවාහය විසුරුවා හැර ඇති අවස්ථාවක නම් ඒ සම්බන්ධව නීත්‍යානුකූල ලියවිලි ලබා දීමට කටයුතු කළ යුතු ය. පෙර විවාහයක් දික්කසාද කර නෛසයි තීන්දු ප්‍රකාශය පමණක් ලබා ඇත්නම් හෝ නියත තීන්දු ප්‍රකාශය ලබා දීමට පෙර නැවත විවාහ වී ඇත්නම් එකී දෙවන විවාහය නීත්‍යානුකූලව වලංගු නොවන අතර ඒ බව අදාළ පාර්ශව වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

2.1.2 නීත්‍යානුකූල විවාහයක් නොපැවතීම

නීත්‍යානුකූලව ලියාපදිංචි නොවී යම් කිසි කාලයක් තුළ එක්ව ජීවත් වී ඇති බව ප්‍රකාශ කරන්නේ නම් එවැනි ගැටළු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ගෙවීම හෝ නොගෙවීම පිළිබඳව පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය. මිය යන අවස්ථාව තෙක් වලංගු විවාහයකට එළඹීමට නොහැකි වන්නා වූ යම් දායකයෙකු වේ නම් එකී වලංගු නොවන විවාහයේ කලත්‍රයාට හෝ අනත්දරුවෙකුට මෙම ප්‍රතිලාභ අහිමි වේ. (මේ සඳහා 1907 අංක 19 දරණ සාමාන්‍ය විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 15, 16, 18 හා 46 වන වගන්ති කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.)

2.1.3 දායකයාගේ පෙර විවාහ නීත්‍යානුකූලව අවසන් කර තිබීම

මිය ගිය විශ්‍රාමිකයෙක් වෙනුවෙන් විවාහ දෙකක භාර්යාවන් හා දරුවන් මෙම ප්‍රතිලාභය සඳහා ඉදිරිපත් වන විට නීත්‍යානුකූල විවාහයේ කලත්‍රයාට හා පළමු විවාහයේ අනත්දරු වයසේ පසුවන (එනම් වයස 26ට අඩු රැකියා විරහිත) දරුවන් සිටී නම් එම දරුවන්ට සමානව විශ්‍රාම වැටුප බෙදී යයි. මෙම අනත්දරුවන්ට හිමි වන කොටස අනත්දරුවන්ට වයස අවුරුදු 26 සම්පූර්ණ වීම හෝ රැකියාවකට එළඹීම යන කරුණු දෙකෙන් මුලින් එළඹෙන අවස්ථාව මත නතර වන අතර එම කොටස අනිත් දරුවන්ගේ වැටුපට එකතු වෙමින් ගෙවා අවසන් වේ. සියලුම අනත්දරුවන්ට ගෙවා අවසන් වූ පසු අනත්දරුවන්ට හිමි වූ කොටස නීත්‍යානුකූල වැන්දඹුවට එකතු කළ යුතු ය.

2.1.4 දායකත්වයෙන් ඉවත් වූ පසු සිදු වන විවාහ.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී සේවා කාලය තුළ හෝ ඊට පෙර දායකයාගේ විවාහය සිදුව තිබිය යුතු ය. අරමුදලේ දායකත්වයෙන් ඉවත් වීමෙන් පසු (විශ්‍රාම ගැනීමෙන්

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

පසු) ගිවිස ගන්නා විවාහයක දරුවන්ට හෝ භාර්යාවට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රතිලාභ හිමි නොවන බව 1898අංක 01 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතේ 43 වන වගන්තියේ සහ 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 25 වන වගන්තියේ සඳහන් වේ.

සැළකිය යුතුයි,

දෙපාර්තමේන්තු වසා දැමීම මත හෝ තනතුර අහෝසි වීම මත හෝ සිවිල් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2-7 වගන්ති අනුව විශ්‍රාම ගන්නා ලද, වයස අවුරුදු 55 දක්වා විවාහ වූ අයවලුන් සඳහා ඔවුන්ගේ කලත්‍රයා වෙත වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010 හි 5 වන වගන්තිය යටතේ අවස්ථාව උදා කර දී ඇත.මෙහි දී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2008 පරිදි අය කළ යුතුව ඇති දායක මුදල් අය කළ යුතුය.

2.2 අතුරුදහන් වූ විශ්‍රාමිකයෙකු වෙනුවෙන් ප්‍රතිලාභ හිමි ගැන්වීම

යම් විශ්‍රාමිකයෙක් අතුරුදහන් වුවහොත් එම විශ්‍රාමිකයා සම්බන්ධයෙන් මරණ සහතිකයක් නිකුත් වීමක් සිදුවී නොමැති බැවින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/92 අනුව කටයුතු කර ඔහු/ඇය අතුරුදහන් වීමෙන් මාස හතරකට පසු වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ගෙවීම සලකා බැලිය හැකි අතර ඒ සඳහා පහත තොරතුරු ලබා ගත යුතු ය.

- අතුරුදහන් වූ විශ්‍රාමිකයා වෙත අවසන් වරට විශ්‍රාම වැටුප් ගෙවූ දිනය
- වැන්දඹුව/වැන්දඹු පුරුෂයා විසින් හෝ අනත්දරුවන් විසින් හෝ අතුරුදහන් වීම පිළිබඳ පොලීසියට කරන ලද පැමිණිල්ලේ පිටපතක් ලබා ගැනීම සහ එම පැමිණිල්ලට අනුව කරන ලද පරීක්ෂණ වල වර්තමාන ප්‍රගතිය සම්බන්ධව පොලිස් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කිරීම.
- වැන්දඹුව/වැන්දඹු පුරුෂයා හෝ අනත්දරුවන් වෙතින් දිවුරුම් සහතිකයක් ලබා ගැනීම. එම දිවුරුම් සහතිකයේ අතුරුදහන් වූ දිනය සහ අතුරුදහන්වීමෙන් පසු ඔහු හෝ ඇය කිසිවෙකු විසින් දැක තිබේ ද යන්න පිළිබඳව තොරතුරු ඇතුලත් විය යුතුය.
- අතුරුදහන් වූ විශ්‍රාමිකයා/විශ්‍රාමිකාව සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් වාර්තා

ඉහත තොරතුරු පිළිබඳව සෑහීමකට පත් විය හැකි වන්නේ නම් අනුමැතිය සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු අතර අනුමැතිය ලබා ගත් පසුව දත්ත පද්ධතිය වෙත ඇතුළත් කල යුතු ය.

2.3 වැන්දඹු විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභී පාර්ශවයෙහි යළි විවාහය හේතුවෙන් ප්‍රතිලාභ හිමි ගැන්වීම.

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

විශ්‍රාම වැටුප් ලබමින් සිටින වැන්දඹුවක/වැන්දඹු පුරුෂයකු යළි විවාහ වුවහොත් ගෙවමින් සිටි වැන්දඹු විශ්‍රාම වැටුප නතර කිරීමත් අනත්දරුවන් සිටීනම් අනත්දරු විශ්‍රාම වැටුප ආරම්භ කිරීමත් සාමාන්‍ය ක්‍රියා පිළිවෙත විය. අනත්දරුවන් නොසිටි අවස්ථාවක දී වැන්දඹු විශ්‍රාම වැටුප නතර කිරීම සිදුවිය.

එහෙත් 2010 අංක 08 දරන සංශෝධිත වැන්දඹු අනත්දරු පනත හා 2010 අංක 9 දරණ වැන්දඹු පුරුෂ සංශෝධිත පනත මඟින් යළි විවාහ වන වැන්දඹුවන් /වැන්දඹු පුරුෂයන් උදෙසා ගෙවමින් පැවති විශ්‍රාම වැටුපෙන් අර්ධයක් හිමි ගැන්වීමේ අවකාශය ලබා දෙන ලදී. මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2010 හි 07 වන වගන්තිය බල පැවැත්වෙන අතර වැන්දඹු විශ්‍රාම වැටුපෙන් අර්ධයක් යළි විවාහ වූ වැන්දඹු භාර්යාවට/වැන්දඹු පුරුෂයාට හිමි ගැන්වීමට පූර්ව අනත්දරුවන් සිටී නම් ඔවුන්ගේ අයිතිය සුරක්ෂිත කිරීමට ද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2013 මඟින් ඉඩ සලසා ඇත.

එමෙන්ම යම් වැන්දඹුවකගේ/වැන්දඹු පුරුෂයකුගේ විවාහය 13/2010 චක්‍රලේඛය ක්‍රියාත්මක වූ 2010-08-17 දිනට පූර්වයෙන් සිදු වූයේ නම් 50% ක ප්‍රතිලාභය සඳහා හිමිකම් පෑමේ දිනය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2014 අනුව 2014-12-31 දිනෙන් අවසන් වී ඇත.
වැන්දඹු භාර්යාවක්/වැන්දඹු පුරුෂයෙක් වැන්දඹු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සඳහා ඉදිරිපත් වන අවස්ථාව වන විට ද යළි විවාහයකට පත්ව සිටී නම් 2010 අංක 8 දරන සංශෝධිත පනතෙහි 34 වගන්තිය අනුව ලැබීමට නියමිතව තිබුණා වූ වැටුපෙන් අර්ධයක් හිමි ගන්වන අතර ඉතිරිව ඇති අර්ධය අනත්දරුවන් සඳහා ගෙවනු ලැබේ.

යම් වැන්දඹුවක/වැන්දඹු පුරුෂයකු එළඹෙන්නා වූ දෙවන විවාහය ද විසුරුවා හරින අවස්ථාවක දී වුව ද ඇය වෙත හිමි වනුයේ 50% ක වැන්දඹු විශ්‍රාම වැටුප් ප්‍රමාණය ම පමණි.

වැන්දඹුවගේ දෙවන කලත්‍රයා ද රජයේ සේවකයෙක් වන්නේ නම් එම දෙවන කලත්‍රයා ද මිය ගිය විට ප්‍රථම කලත්‍රයාගෙන් හිමිගන්වන ලද 50% ක වැටුප නතර විය යුතු අතර දෙවන කලත්‍රයා වෙනුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ආරම්භ කළ යුතු ය.

3. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී සලකා බැලිය යුතු සුවිශේෂී ගැටලු

3.1 <u>වැන්දඹු විශ්‍රාම වැටුප් ලාභියෙකු විසින් දරුවන් නොතකා හැරීම</u>

මෙම ක්‍රමය යටතේ ප්‍රතිලාභ ඉල්ලුම් කරන හෝ ප්‍රතිලාභ ලබා ගන්නා වැන්දඹුවක්/වැන්දඹු පුරුෂයෙක් තමාගේ දරුවන් නොතකා හැරීමකට ලක් කර ඇති බවට වාර්තා වන්නේ නම් ඒ පිළිබඳ සත්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. මෙහිදී කාර්යාල පරීක්ෂණ, ප්‍රාදේශීය ලේකම් වාර්තා ඇසුරෙන් කරුණු තහවුරු කර ගැනීමෙන් අනතුරුව වැන්දඹු විශ්‍රාම වැටුපෙන් කවර කොටසක් දරුවන් සඳහා හිමිගන්වන්නේ ද යන්න තීරණය සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

ඒ අනුව වැන්දඹු භාර්යාවට/වැන්දඹු පුරුෂයාට හා නොතකා හැරීමට ලක් වූ දරුවන්ට හිමි ගන්වනු ලබන වැන්දඹු විශ්‍රාම වැටුප් ප්‍රමාණය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ. දරුවන්ට හිමිගන්වනු ලබන්නා වූ වැන්දඹු විශ්‍රාම වැටුපෙහි කොටස භාර්යාවට/පුරුෂයාට නැවත කිසි කලෙක හිමි ගන්වනු නොලැබේ. 1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු අරමුදල් ආඥා පනතේ 39 වන වගන්තිය හා 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 22 වන වගන්තිය මේ සම්බන්ධයෙන් බල පැවැත්වේ.

3.2 වැන්දඹු විශ්‍රාම වැටුප භාරකාරත්වයක් යටතේ හිමි ගැන්වීම

යම් වැන්දඹුවක්/වැන්දඹු පුරුෂයෙක් ප්‍රතිලාභය ඉල්ලුම් කරන අවස්ථාවේ දී හෝ වැන්දඹු විශ්‍රාම වැටුප් ලබමින් සිටින අවස්ථාවක දී මානසික ව්‍යාකූලතාවයක් (මානසික රෝග) හෝ විශ්‍රාම වැටුප් ලබා ගැනීමට නොහැකි සදාකාලික රෝගයකින් පසු විය හැකිය. එවිට එම කලත්‍රයා වෙනුවෙන් සුදුසු භාරකාරත්වයක් යටතේ භාරකාර 1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු අරමුදල් ආඥා පනතේ 38 වන වගන්තියට අනුව හිමිගැන්වීමට කටයුතු කරනු ලැබේ.

මෙවැනි අවස්ථාවක දී ,

I. රෝගී ස්වභාවය පිළිබඳ වෛද්‍ය වාර්තා හා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී සහතිකයක් ලබා ගැනීම

II. භාරකාරත්වය දිවුරුම් සහතිකයක් ලබා ගැනීම

III. ප්‍රාදේශීය ලේකම් වෙතින් භාරකාරත්වය සම්බන්ධ වාර්තාවක් කැඳවීම.

මෙම වාර්තාවේ වැන්දඹු භාර්යාවගේ /වැන්දඹු පුරුෂයාගේ රෝගී ස්වභාවය, ඉදිරිපත් වන භාරකරුගේ ඥාතීත්වය, භාරකරු විසින් අදාල වැන්දඹුව/වැන්දඹු පුරුෂයා ගේ සුභසිද්ධිය සඳහාම මෙම විශ්‍රාම වැටුප භාවිත කිරීම පිළිබඳ සෑහීමට පත්විය හැකි ද යන්න පිළිබඳ වාර්තා කැඳවීම තුළින් සෑහීමට පත්විය හැකි නම් අනුමැතිය සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු කළ යුතුය.

3.3 විවාහයෙන් වසරක් ඇතුළත දරුවන් නොලබා දායකයා මිය ගොස් ඇති අවස්ථාවක කටයුතු කිරීම.

මෙවන් අවස්ථාවක 1890 අංක 01 දරණ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 28 වගන්තිය, 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 11 වන වගන්තිය හා 1970 අංක 18 දරණ වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනතේ 27(1) ප්‍රකාරව වැන්දඹුව වෙත හිමිකම නැත. එවැනි ඉල්ලීම් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු ය.

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

එසේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපක් හිමිගන්වන ලද වැන්දඹුවක නැවත විවාහ වූ විට එම වැන්දඹුවට නැවත 50%ක ප්‍රතිලාභය ලබා දීම සඳහා තීරණයක් ගැනීම උදෙසා නැවත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කළ යුතු ය.

4. අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ දී කටයුතු කළ යුතු ආකාරය

මෙම ක්‍රමය යටතේ අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අත්පත් කිරීමේ දී වයස අවු.18ට අඩු දරුවෙකු හෝ දරුවන් කිහිප දෙනෙකු සිටී නම් ඔවුන් සඳහා නිසි රැකවරණය හා පෝෂණය සැලසිය හැකි භාරකාරත්වයක් නිර්දේශ කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් කළ යුතුය.භාරකාරත්වය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු ය. එකී භාරකාරත්වය යටතේ දරුවා/දරුවන් සඳහා විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී එකවර ගෙවිය යුතු යම් හිඟ විශ්‍රාම වැටුපක් වේ නම් දරුවාගේ අනාගත සුභසිද්ධිය සඳහා දරුවා නමින් වූ ගිණුමක එය තැන්පත් කළ යුතු අතර භාරකාරත්වයට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපෙන් ප්‍රමාණයක් තැන්පතු වශයෙන් දරුවාගේ ගිණුමට යොමු කළ යුතු ය.

අනත්දරුවාට වයසඅවු.18 සම්පූර්ණ වූ පසු පත්කරන ලද භාරකාරත්වයෙන් ඉවත් කර දරුවා නමින් ම විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කළ යුතු අතර අවස්ථානුකූලව දරුවාගේ රැකියාමය තත්ත්වය හෝ වයස අවු. 26 සම්පූර්ණ වීම යන කරුණු විමසා පළමු අවස්ථාවේ දී ම අනත්දරු විශ්‍රාම වැටුප අත්හිටු වීමට කටයුතු කළ යුතු ය.

2010 අංක 08 දරන සංශෝධිත වැන්දඹු අනත්දරු පනත අනුව අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී දරුවාගේ විවාහකත්වය බලපානු නොලැබේ. එමෙන්ම විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/99හි විධිවිධාන ද අනත්දරු ගෙවීමක දී අදාල වේ.

4.1 කුලවද්දා ගන්නා ලද දරුවන් සඳහා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම

අනත්දරුවන් සඳහා හිමිකම සලකා බැලීමේ දී නිලධාරියෙකු අරමුදලේ දායකත්වය දරමින් සිටින අවස්ථාවේ දී දරුකමට හදා ගනු ලබන යම් නීතියක් යටතේ හෝ කුලවද්දා ගැනීමේ නීතිය යටතේ හෝ හදා වඩා ගනු ලබන දරුවන් සඳහා ද ප්‍රතිලාභ හිමි ගැන්වීමේ හැකියාව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට කරන ලද සංශෝධනයට අනුව හිමිව ඇත.

5. පොදු ගැටළු

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

5.1 නම්වල පවත්නා වෙනස්කම්

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ දී අනිවාර්ය අංගයක් වන හිමිකම තහවුරු කිරීම උදෙසා වැන්දඹුවගේ, වැන්දඹු පුරුෂයාගේ,අනත්දරුවාගේ, ආබාධිත අනත්දරුවාගේ මෙන් ම දායකයාගේ නම් ඔවුන්ගේ සියළුම ඉදිරිපත් කරන ලද ලියකියවිලිවල සමාන ආකාරයට යෙදී තිබිය යුතු ය.

5.1.1 දායකයාගේ නම වෙනස් වීම

දායකයාගේ නම වෙනස් වූ විට එම නම් තහවුරු කිරීම සඳහා දායකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය, ග්‍රාම නිලධාරී වාර්තා, ප්‍රභූ වාර්තා, මැතිවරණ උධෘත ආදී ලියකියවිලි කැඳවා පරීක්ෂණයක් පවත්වා එම පරීක්ෂණ වාර්තාව මත දායකයාගේ නම තහවුරු කරගත යුතු ය.දත්ත පද්ධතියට එක් කර ඇති වැන්දඹු අනත්දරු ගොනු පරීක්ෂා කර බලා දායකයා ජීවතුන් අතර සිටින කාලය තුල දායකයාගේ නම යම් කිසි සංශෝධනයකට ලක් කර ඇත් ද යන්න තහවුරු කර ගත යුතු ය.මේ කිසිදු අයුරකින් තහවුරු කරගත නොහැකි දායකයෙකුගේ නමක් වේ නම් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් අත්හිටුවීම සිදු කළ යුතු ය.

5.1.2 වැන්දඹුවගේ නමේ පවතින වෙනස්කම්

වැන්දඹුවගේ නමේ වෙනස්කම් පවතී නම් එම වෙනස්කම් තහවුරු කර ගැනීමට ග්‍රාම නිලධාරි වාර්තා, මැතිවරණ උධෘත, ප්‍රභූ වාර්තා ආදිය යොදා ගනිමින් පරීක්ෂණයක් පවත්වා නම තහවුරු කරගත යුතු ය. එසේ තහවුරු කරගත නොහැකි නම් තම නම නීත්‍යානුකූලව තහවුරු කරන ලෙස වැන්දඹුවට දැනුම් දිය යුතු ය.

නමක පවත්නා වෙනසක් සඳහා දිවුරුම් ප්‍රකාශයක් පිළිගත හැක්කේ නමක ඉතා සුළු වෙනසක් පැවතීම හෝ විවාහයෙන් පසුව වැන්දඹුව විසින් දායකයාගේ නම භාවිත කළ බව තහවුරු වන්නේ නම් පමණි.

5.2 වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී තිබීම

වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපකට හිමිකම් කීම සඳහා දායකයා/දායිකාව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී තිබීම අනිවාර්ය වේ.

දැනට වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී සිටින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු හා අනත්දරු ලේඛනාගාරයේ පවතින 82,83, M,F කාණ්ඩයේ වැන්දඹු හා වැන්දඹු පුරුෂ ගොනු පරිලෝකනය කොට, වැන්දඹු හා අනත්දරු ගොනු පරිලෝකන ව්‍යාපෘතියේ දත්ත

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

පද්ධතියට ඇතුළත් කොට ඇති අතර දැනට සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට එම දත්ත පද්ධතියට පිවිස එම ගොනු පිරික්සා බැලීමට පහසුකම් සපයා ඇත.

මෙම දත්ත පද්ධතියට ඇතුළත්ව නොමැති වැන්දඹු හා අනත්දරු ගොනුවක් වේ නම් එම ලියාපදිංචි අංකය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු හා අනත්දරු අංශය වෙත යොමු කර එම ගොනු ලේඛනාගාරය තුළ පවතීද යන්න තහවුරු කරගත යුතු ය. එසේ ලේඛනාගාරය තුළ ගොනුවක් නොපවතින්නේ නම් හෝ එම අංකයට වෙනත් අයෙකු ලියාපදිංචි වී ඇත්නම් අදාල දායකයා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 2/2016 අනුව මාර්ගගත ක්‍රමය ඔස්සේ වැන්දඹු අනත්දරු ක්‍රමයේ අලුතින් ලියාපදිංචි කිරීම සඳහා එම දයකයා අවසන් වරට සේවය කරන ලද ආයතනය වෙතට වැන්දඹුව යොමු කළ යුතු ය.

1983/08/01 දිනට පෙර පත්වීම් ලද රජයේ සේවිකාවන් සඳහා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ලියාපදිංචි වීම සඳහා 2014/12/31 දිනට පෙර මනාප පරිශිෂ්ඨයක් ලබා දී තිබිය යුතු අතර දායක මුදල් ද එම දිනට පෙර ගෙවා තිබිය යුතු බව වැන්දඹු පුරුෂයා දැනුවත් කළ යුතු ය.

මෙලෙස මනාප පරිශිෂ්ඨය ලබා දී නොමැති හා දායක මුදල් අය වී නොමැති දායිකාවකගේ වැන්දඹු පුරුෂයෙක් සඳහා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දිය නොහැකි ය.

5.3 ලිපි ගොනු අස්ථානගතව ඇති විටක කටයුතු කළ යුතු ආකාරය.

විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප් ලිපිගොනුවක් යම් කිසි හේතුවක් මත අස්ථානගතව ඇත්නම් එම විශ්‍රාමිකයා සඳහා විශ්රාම වැටුප් චක්‍රලේඛ 13/2001 අනුව තාවකාලික ලිපි ගොනුවක් සකස් කර ඉදිරි කටයුතු සිදු කළ යුතුය.

©විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි. අවසරයකින් තොරව උපුටා ගැනීම, පිටපත් කිරීම, අන්සතු කිරීම තහනම්

වැන්දඹු/වැන්දඹු පුරුෂ / අනත්දරු/ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම්

අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ යොමු කිරීම

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය වඩාත් නිරවද්‍ය හා කාර්යක්ෂමව සිදු කිරීමේ අරමුණින් වැන්දඹු,වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ලබා ගැනීම සඳහා 2020.02.25 දිනැතිව අංක 3/2020 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ප්‍රතිලාභී පාර්ශවය වෙත කඩිනමින් ම ප්‍රතිලාභ හිමිකර දීමේ දීහැකිතාක් නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහාලිපි ගොනුව ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනට යැවීමට ප්‍රථම අදාළ ඇමුණුම සමඟ පිරික්සුම් ලේඛනයගොනුවට ඇතුළත් කළ යුතුය.

1. ඇමුණුම 1 - විශ්‍රාම වැටුප් ලබා මියයන විශ්‍රාමිකයන්ගේ හිමිකම සම්බන්ධයෙන් කටයුතු කිරීම
2. ඇමුණුම 2 - අතුරුදහන් වූ විශ්‍රාමිකයෙකු හෝ විශ්‍රාමිකාවකාවන්ගේ හිමිකම සම්බන්ධයෙන් කටයුතු කිරීම
3. ඇමුණුම 3 - වැන්දඹුව/ වැන්දඹු පුරුෂයා යළි විවාහ වීමෙන් පසු හිමිකම සම්බන්ධයෙන් කටයුතු කිරීම
4. ඇමුණුම 4 - අනත්දරු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කටයුතු කිරීම
5. ඇමුණුම 5 - විවාහයෙන් වසරක් ඇතුළත දරුවන් නොලබා මියගිය දායක/දායිකාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම

ඇමුණුම 1

01. **විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයෙකු හෝ විශ්‍රාමිකාවක වෙනුවෙන් ප්‍රතිලාභ හිමි ගැන්වීම**

01. වැන්දඹු,වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී මූලිකව විමසිය යුතු දෑ,

(අවධානයට ලක්විය යුතු පොදු කරුණු)

		ඔව්/ඇත	නැත
01.	දායකයාගේ විවාහ සහතිකය		
02.	දායකයාගේ මරණ සහතිකය		
03.	දායකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදානය		
04.	ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්		
05.	ඉල්ලුම්කරුගේ බැංකු ගිණුමෙහි සහතික පිටපතක්		
06.	දෙපාර්ශවයේ නම්වල වෙනස්කම් තිබේ නම් සනාථ කර තිබේ ද (නීත්‍යානුකූලව සනාථ කර තිබිය යුතුය)		
07.	වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි සාමාජික අංකය තිබේ ද		
08.	දායක මුදල් අයව තිබේ ද (හිඟ දායක මුදල් අය කිරීමට තිබේ නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 අනුව කටයුතු කළ යුතුව ඇත.)		
09.	විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීමක් සිදුවී තිබේ ද		
10.	දායකයා මියගිය පසු විශ්‍රාම වැටුප ගෙවීමක් සිදුව තිබේ ද		
10.1	(මියගිය පසුවත් විශ්‍රාම වැටුප ගෙවා තිබේ නම්) එසේ නම් ,මියගිය පසු යොමුව ඇති විශ්‍රාම වැටුප අධිභාර වී තිබේ ද		

02.<u>විශ්‍රාම වැටුප් ලබා මියයන විශ්‍රාමිකයන්ගේ හිමිකම තහවුරු කර ගැනීම</u>

(විශේෂයෙන් අවධානය යොමු විය යුතු කරුණු)		ඔව්	නැත
01.	විවාහය වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි දායකත්වයෙන් ඉවත් වීමට පූර්වයෙන් සිදුව තිබේ ද?		
02.	විශ්‍රාමිකයාට පෙර විවාහ තිබුණේ ද හෝ කලත්‍රයාට පෙර විවාහ තිබුණේ ද? (ඔව් නම්),		
2.1.	එම විවාහයේ අවසානය තහවුරුවන ලේඛන ඉදිරිපත් කර තිබේ ද		
2.1.1.	දික්කසාදයේ නියත තීන්දුව		
2.1.2.	මරණ සහතිකය		
03.	දායකයාගේ/ දායිකාවගේ පෙර විවාහයන් හි අනත්දරු හිමිකම සලකා බැලිය හැකි අනත්දරුවන් හෝ ආබාධිත අනත්දරුවන් සිටින්නේ ද,		
3.1.	(අනත්දරුවන් සිටින්නේ නම්), දරුවන්ගේ උප්පැන්න සහතික ලබා ගත්තේ ද		
3.2.	අනත්දරුවන්ගේ රැකියා විරහිත බව තහවුරු කර ගනු ලැබුවේ ද		
3.3.	වයස අවු.18 ට අඩු දරුවන් සඳහා නිසි රැකවරණය හා පෝෂණය සැලසිය හැකි භාරකාරත්වයක් පත් කර තිබෙන්නේ ද		
3.4.	දායකයාට හෝ දායිකාවට එක් විවාහයකට වඩා වැඩි විවාහ ගණනක් තිබුණේ නම් වැන්දඹු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ප්‍රතිලාභ ඉල්ලුම් කරන පාර්ශවයෙහි නීත්‍යානුකූල හිමිකාරිත්වය තහවුරු කර ගනු ලැබුවේ ද		

ඉහත සාරාංශගත කරුණු හා වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී බලපාන්නා වූ සියළු කරුණු අධ්‍යයනයෙන් වැන්දඹු අනත්දරු පනතෙහි පහත විධි විධාන අනුව ප්‍රතිලාභ හිමි ගන්වා ඇති බව තහවුරු කිරීම අනිවාර්යයයි.

		ඔව්	නැත
01.	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප වැන්දඹු අනත්දරු අරමුදල් පනතේ 18 වන වගන්තිය අනුව විවාහයේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගෙන ඇද්ද,		
	ඉහත විධිවිධාන අනුව හිමි ගැන්වීමේ හැකියාවක් නොමැති බැවින් ප්‍රතික්ෂේප කරන ලදී.		
02.	(අ) විශ්‍රාමයෙන් පසු විවාහයක් බැවින් ද, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2010 හි 5 අනුව හිමිකමක් නොමැති බැවින් ද, පනතෙහි 43 වන වගන්තිය අනුව හිමි ගැන්වීමට හැකියාවක් නොමැති බැවින් ද, ප්‍රතික්ෂේප කරන ලදී.		
	(ආ) පනතෙහි 43 වන වගන්තිය අනුව හිමිකමක් නොමැති නමුත් 13/2010 හි 5 අනුව හිමිකමක් පවතින බැවින් ප්‍රතිලාභ හිමි ගන්වන ලදී.		

සැකසීම - .... නිර්දේශය - ....

පරීක්ෂාව - .... අනුමැතිය - ....

ඇමුණුම **2**

02. අතුරුදහන් වූ විශ්‍රාමිකයෙකු වෙනුවෙන් ප්‍රතිලාභ හිමි ගැන්වීම

01. වැන්දඹු,වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී මූලිකව විමසිය යුතු දෑ,

(අවධානයට ලක්විය යුතු පොදු කරුණු)

		ඔව්/ඇත	නැත
01.	දායකයාගේ විවාහ සහතිකය		
02.	දායකයාගේ මරණ සහතිකය		
03.	දායකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදානය		
04.	ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්		
05.	ඉල්ලුම්කරුගේ බැංකු ගිණුමෙහි සහතික පිටපතක්		
06.	දෙපාර්ශවයේ නම්වල වෙනස්කම් තිබේ නම් සනාථ කර තිබේ ද (නීත්‍යානුකූලව සනාථ කර තිබිය යුතුය)		
07.	වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි සාමාජික අංකය තිබේ ද		
08.	දායක මුදල් අයව තිබේ ද (හිඟ දායක මුදල් අය කිරීමට තිබේ නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 අනුව කටයුතු කළ යුතුව ඇත.)		
09.	වැඩිපුර ගෙවීමක් සිදුවී තිබේ ද		
10.	දායකයා අතුරුදහන් වූ පසු විශ්‍රාම වැටුප ගෙවීමක් සිදුව තිබේ ද? දායකයා විසින් ATM කාඩ්පතක් භාවිතා කර තිබේද? එසේ නැතහොත් වෙනත් අයෙකු විසින් විශ්‍රාම වැටුප ලබාගෙන තිබේද?		
10.1	(අතුරුදහන් වූ පසුවත් විශ්‍රාම වැටුප ගෙවා තිබේ නම්) එසේ නම් ,මියගිය පසු යොමුව ඇති විශ්‍රාම වැටුප අධිභාරයක් වී		

	තිබේද?		

02. අතුරුදහන් වූ විශ්‍රාමිකයෙකු සම්බන්ධයෙන් කටයුතු කිරීම (අදාළ නම් පමණක්)

(විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 10/92 අනුව කටයුතු කළ යුතුය.)

		ඔව්	නැත
01	අතුරුදහන් වූ බවට පොලිස් පැමිණිල්ලේ පිටපතක් ඉදිරිපත් කර තිබේද		
02.	එකී පැමිණිල්ලේ වර්තමාන තත්ත්වය පිළිබඳ පොලිස් ස්ථානයෙන් විමසා කටයුතු කර තිබේ ද		
03.	අතුරුදහන් වූ පුද්ගලයා එකී දිනයෙන් පසු කිසිවෙකු හෝ දැක තිබේ ද යන්න පිළිබඳ වාර්තාවන් කැඳවා තිබේ ද		
04.	වැන්දඹු ප්‍රතිලාභ සඳහා ඉදිරිපත් වන අයගෙන් ලබා ගත් දිවුරුම් ප්‍රකාශයක් ගොනුවෙහි අන්තර්ගත වන්නේ ද		
05.	අතුරුදහන් වූ බවට වාර්තා වී මාස 04 ක් ඉකුත්ව ගොස් තිබේ ද		
06.	සිවිල් විශ්‍රාම වැටුප් අත්හිටුවීමට කටයුතු කර තිබේ ද		
07.	ඉහත තොරතුරු සමඟ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යොමු කර අනුමැතිය ලබා තිබේ ද		

ඉහත සාරාංශගත කරුණු හා වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී බලපාන්නා වූ සියළු කරුණු අධ්‍යයනයෙන් වැන්දඹු අනත්දරු පනතෙහි පහත විධි විධාන අනුව ප්‍රතිලාභ හිමි ගන්වා ඇති බව තහවුරු කිරීම අනිවාර්යයයි.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප වැන්දඹු අනත්දරු අරමුදල් ආඥා පනතේ 18 වන වගන්තිය අනුව විවාහයේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගෙන, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 10/92 අනුව විශ්‍රාමිකයා අතුරුදහන් වීමෙන් මාස හතරක් ඉක්ම ගොස් ඇති බැවින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු, ආබාධිත අනත්දරු ප්‍රතිලාභ හිමිගන්වන ලදී.

සැකසීම - .... නිර්දේශය - ....

පරීක්ෂාව - .... අනුමැතිය - ....

ඇමුණුම 3

03. වැන්දඹු, වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභී පාර්ශවය යළි විවාහ වීමෙන් පසු හිමිකම සම්බන්ධයෙන් කටයුතු කිරීම

01. වැන්දඹු,වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී මූලිකව විමසිය යුතු දෑ,

(අවධානයට ලක්විය යුතු පොදු කරුණු)

		ඔව්/ඇත	නැත
01.	දායකයාගේ විවාහ සහතිකය		
02.	දායකයාගේ මරණ සහතිකය		
03.	දායකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදානය		
04.	ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්		
05.	ඉල්ලුම්කරුගේ බැංකු ගිණුමෙහි සහතික පිටපතක්		
06.	දෙපාර්ශවයේ නම්වල වෙනස්කම් තිබේ නම් සනාථ කර තිබේ ද (නීත්‍යානුකූලව සනාථ කර තිබිය යුතුය)		
07.	වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි සාමාජික අංකය තිබේ ද		
08.	දායක මුදල් අයව තිබේ ද (හිඟ දායක මුදල් අය කිරීමට තිබේ නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 අනුව කටයුතු කළ යුතුව ඇත.)		
09.	වැඩිපුර ගෙවීමක් සිදුවී තිබේ ද		
10.	දායකයා මියගිය පසු විශ්‍රාම වැටුප ගෙවීමක් සිදුව තිබේ ද		

10.1	(මියගිය පසුවත් විශ්‍රාම වැටුප ගෙවා තිබේ නම්) එසේ නම්, මියගිය පසු යොමුව ඇති විශ්‍රාම වැටුප අධිභාර වී තිබේ ද?		

04. වැන්දඹු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභී පාර්ශවයෙහි යළි විවාහ වීමෙන් ප්‍රතිලාභ හිමි ගැන්වීම (50%)

(අදාළ නම් පමණක්)

	(විශේෂයෙන් අවධානය යොමු විය යුතු කරුණු)	ඇත/ඔව්	නැත
01.	දෙවන වරට විවාහ වූ විවාහ සහතිකය ලබා ගත්තේ ද		
02.	50% හිමිකම සලකා බැලීමට පූර්ව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2013 අනුව අනත්දරු හිමිකම සලකා බැලිය හැකි දරුවන් සිටී ද,		
02.1	(දරුවන් සිටින්නේ නම්) පළමුව අනත්දරු හිමිකම සලකා බැලීමේ කටයුතු කළ යුතු බැවින් ඒ අනුව කටයුතු සිදු කර තිබේ ද		
03.	යළි විවාහයෙන් පසු ගෙවා ඇති වැන්දඹු විශ්‍රාම වැටුපක් වේ නම් නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කර තිබේ ද		

ඉහත සාරාංශගත කරුණු හා වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී බලපාන්නා වූ සියළු කරුණු අධ්‍යයනයෙන් වැන්දඹු අනත්දරු පනතෙහි පහත විධි විධාන අනුව ප්‍රතිලාභ හිමි ගන්වා ඇති බව තහවුරු කිරීම අනිවාර්යයයි.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2010 හි 7 වන වගන්තිය අනුව 50% ක් වූ ප්‍රතිලාභ හිමිගැන්විය හැකි බව තහවුරු කර හිමිකම ලබා දෙන ලදි.

සැකසීම - .... නිර්දේශය - ....

පරීක්ෂාව - .... අනුමැතිය - ....

ඇමුණුම 4

04. වැන්දඹු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කටයුතු කිරීම

01. වැන්දඹු,වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී මූලිකව විමසිය යුතු දෑ,

(අවධානයට ලක්විය යුතු පොදු කරුණු)

		ඔව්/ඇත	නැත
01.	දායකයාගේ විවාහ සහතිකය		
02.	දායකයාගේ මරණ සහතිකය		
03.	දායකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදානය		
04.	ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්		
05.	ඉල්ලුම්කරුගේ බැංකු ගිණුමෙහි සහතික පිටපතක්		
06.	දෙපාර්ශවයේ නම්වල වෙනස්කම් තිබේ නම් සනාථ කර තිබේ ද (නීත්‍යානුකූලව සනාථ කර තිබිය යුතුය)		
07.	වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි සාමාජික අංකය තිබේ ද		
08.	දායක මුදල් අයව තිබේ ද (හිඟ දායක මුදල් අය කිරිමට තිබේ නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 අනුව කටයුතු කළ යුතුව ඇත.)		
09.	වැඩිපුර ගෙවීමක් සිදුවී තිබේ ද		

10.	දායකයා මියගිය පසු විශ්‍රාම වැටුප ගෙවීමක් සිදුව තිබේ ද		
10.1	එසේ නම්, මියගිය පසු යොමුව ඇති විශ්‍රාම වැටුප අධිභාර වී තිබේ ද		

02**. අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම සලකා බැලීම (අදාල නම් පමණක්)**

	(විශේෂයෙන් අවධානය යොමු විය යුතු කරුණු)	ඇත/ඔව්	නැත
01.	දෙමාපියන්ගේ විවාහ සහතිකය ඉදිරිපත් කර තිබෙන්නේ ද		
02.	දායකයාගේ හෝ දායිකාවගේ මරණ සහතිකය සමඟ කලත්‍රයාගේ මරණ සහතිකය ලබා දී තිබෙන්නේ ද		
03.	දරුවන්ගේ උප්පැන්න සහතික ලබා තිබෙන්නේ ද		
04	කුලවද්දා ගත් දරුවෙකු සම්බන්ධයෙන් වූ විට දායකත්වයේ සිටියදී දරුකමට හදා ගැනීමට ගත් බව උප්පැන්නයෙන් තහවුරු වන්නේ ද		
04.1.	(කුලවද්දා ගත් දරුවෙකු නම්) කුලවැද්දුම් සහතිකය කැඳවන ලද්දේ ද		
05.	වයස අවු.18 ට අඩු දරුවන් සිටින්නේ නම්, නිසි රැකවරණය හා පෝෂණය සැලසිය හැකි භාරකාරත්වයක් පත් කර,(7/2020 අනුව භාරකාර ගිවිසුම ද සමඟ) අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීමට අදාල සියළු ලේඛන සමඟ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබුවේ ද		
06.	වයස අවු.18 ට වැඩි දරුවන් සම්බන්ධයෙන් වූ විට, රැකියා විරහිත බව තහවුරු කර ගත්තේ ද		
06.1	දරුවා විවාහක නම් විවාහ සහතිකය ලබා ගැනීමත් එහි තොරතුරු සමඟ අනත්දරු හිමිකම සඳහා ඉදිරිපත් කරන තොරතුරු වල පරස්පරතාවයක් නොමැති ද (උදා- රැකියා විරහිත බව පිළිබඳ)		
06.2	භාරකාරත්වයෙන් තොරව දරුවා නමින් ම හිමිකම ලබා දීම සඳහා කටයුතු කරනු ලැබුවේ ද		

07.	අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ලේඛනයෙහි රැකියාවක් ලැබීමේ දී හෝ වයස අවු.26 සම්පූර්ණ වීමකදී නතර කිරීමට සටහන් කර ගනු ලැබුවේ ද		
06.	දායකයා හෝ දායිකාව මියයාමෙන් කලත්‍රයා වෙතින් නිසි රැකවරණය හා පෝෂණය නොලැබෙන බවට අනත්දරුවන් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වන අවස්ථාවක දී ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාවක් සමඟ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතිය සඳහා යොමු කරන ලද්දේ ද		

ඉහත සාරාංශගත කරුණු හා වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිගැන්විමේ දී බලපාන්නා වූ සියළු කරුණු අධ්‍යයනයෙන් වැන්දඹු අනත්දරු ආඥා පනතෙහි පහත විධි විධාන අනුව ප්‍රතිලාභ හිමි ගන්වා ඇති බව තහවුරු කිරීම අනිවාර්යයයි.

		ඔව්	නැත
01.	දරුවන් නොතකා හැරීම මත හිමි ගැන්වීමක් බැවින් වැන්දඹු අනත්දරු අරමුදල් පනතේ 39 හෝ වැන්දඹු පුරුෂ අනත්දරු පනතේ 22 ප්‍රකාරව නිසි අනුමැතිය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ලබා ඇති ද		
02.	විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/99 ප්‍රකාරව අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට බාධාවක් නොමැති බැවින් හිමිකම ලබා දෙන ලදී.		
03.	විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 1/2009 හා 1719/3 අති විශෙෂ ගැසට් නිවේදනය පරිදි අබාධිත විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ හැකියාවක් පවතින බැවින් හිමිකම ලබා දෙන ලදී.		

සැකසීම - .... නිර්දේශය - ....

පරීක්ෂාව - .... අනුමැතිය - ....

ඇමුණුම 5

05. විවාහයෙන් වසරක් ඇතුළත දරුවන් නොලබා මියගිය දායක/දායිකාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම

01. වැන්දඹු,වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී මූලිකව විමසිය යුතු දෑ,

(අවධානයට ලක්විය යුතු පොදු කරුණු)

		ඔව්/ඇත	නැත
01.	දායකයාගේ විවාහ සහතිකය		
02.	දායකයාගේ මරණ සහතිකය		
03.	දායකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදානය		
04.	ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්		
05.	ඉල්ලුම්කරුගේ බැංකු ගිණුමෙහි සහතික පිටපතක්		
06.	දෙපාර්ශවයේ නම්වල වෙනස්කම් තිබේ නම් සනාථ කර තිබේ ද (නීත්‍යානුකූලව සනාථ කර තිබිය යුතුය)		
07.	වැන්දඹු අනත්දරු ක්‍රමයෙහි සාමාජික අංකය තිබේ ද		
08.	දායක මුදල් අයව තිබේ ද (හිඟ දායක මුදල් අය කිරීමට තිබේ නම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2008 අනුව කටයුතු කළ යුතුව ඇත.)		

09.	වැඩිපුර ගෙවීමක් සිදුවී තිබේ ද		
10.	දායකයා මියගිය පසු විශ්‍රාම වැටුප ගෙවීමක් සිදුව තිබේ ද		
10.1	(මියගිය පසුවත් විශ්‍රාම වැටුප ගෙවා තිබේ නම්) එසේ නම්, මියගිය පසු යොමුව ඇති විශ්‍රාම වැටුප අධිභාර වී තිබේ ද		

02. විවාහයෙන් වසරක් ඇතුළත දරුවන් නොලබා මියගිය දායක/දායිකාවන් වෙනුවෙන්

ප්‍රතිලාභ හිමි ගැන්වීමකදී, (අදාල නම් පමණක්)

	(විශේෂයෙන් අවධානය යොමු විය යුතු කරුණු)	ඔව් / ඇත	නැත
01.	විවාහය නීත්‍යානුකූල වන්නේ ද		
02.	විශ්‍රාම වැටුප ඉලක්ක කර ගනිමින් සිදුවූ විවාහයක් නොවන බව තහවුරු වන්නේ ද		
03.	දායකයාගේ පාලනයෙන් බැහැරව සිදුවූ අනපේක්ෂිත මරණයක් බවට සැලකිය හැකිද		
04.	විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර අනුමැතිය ලබා තිබේ ද		

ඉහත සාරාංශගත කරුණු හා වැන්දඹු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී බලපාන්නා වූ සියළු කරුණු අධ්‍යයනයෙන් වැන්දඹු අනත්දරු පනතෙහි පහත විධි විධාන අනුව ප්‍රතිලාභ හිමි ගන්වා ඇති බව තහවුරු කිරීම අනිවාර්යයයි.

		ඔව්	නැත
01.	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප වැන්දඹු අනත්දරු අරමුදල් ආඥා පනතේ 18 වන වගන්තිය අනුව විවාහයේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගෙන ඇද්ද,		
	ඉහත විධිවිධාන අනුව හිමි ගැන්වීමේ හැකියාවක් නොමැති බැවින් ප්‍රතික්ෂේප කරන ලදී.		
02.	වැන්දඹු හා අනත්දරු අරමුදල් ආඥා පනතෙහි 28 වන වගන්තිය හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනතෙහි 11 වන වගන්තිය පරිදි හෝ 1970 අංක 18 දරණ වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනතෙහි 27 (1) පරිදි හෝ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා තිබේ ද		

සැකසීම - ....

නිර්දේශය - ....

පරීක්ෂාව - ....

අනුමැතිය - ....